# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

# දැන්වීම යි

**2025 (2026) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ <u>නැවත සමීක්ෂණ ප්‍රතිඵල සහ රඳවාගත් ප්‍රතිඵල නිකුත් වීම මත</u> විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයැදුම් කිරීමට සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගෙන් 2025/2026 අධ්‍යයන වර්ෂය සඳහා අයදුම්පත් කැඳවීම**

2026 ජුලි මස නිකුත් කරන ලද 2025 (2026) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ නැවත සමීක්ෂණ ප්‍රතිඵල සහ රඳවාගත් ප්‍රතිඵල මත 2025/2026 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයැදුම් කිරීමට සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගෙන් **2026 අගෝස්තු මස 21 දින සිට 2026 සැප්තැම්බර් මස 04 වැනි දින දක්වා** අන්තර්ජාලය ඔස්සේ අයදුම්පත් කැඳවීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තීරණය කර ඇත.

අයදුම්පත් යොමු කිරීම සම්බන්ධ වැඩිදුර විස්තර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙහි (www.ugc.ac.lk) 2025/2026 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශයට අදාළ අයදුම්පත් කැඳවීම හා සම්බන්ධව මින් පෙර පළ කරන ලද පුවත්පත් නිවේදනයෙහි දක්වා ඇත.

**වැදගත්**

පාඨමාලා සඳහා වන කැමැත්තේ අනුපිළිවෙළ වෙනස් කිරීම සඳහා **2026 සැප්තැම්බර් මස 04 වැනි දින සිට 2026 සැප්තැම්බර් මස 11 වැනි දින දක්වා** සතියක කාලයක් ලබා දෙන බව දන්වා සිටිමි.

තව ද, ඉහත සඳහන් කර ඇති අයුරින් 2025/2026 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්පත් යොමු කිරීමට ලබා දී ඇති අවස්ථාව අදාළ විශ්වවිද්‍යාල/ මණ්ඩපය/ උසස් අධ්‍යාපන ආයතනය මඟින් පවත්වා අවසන් කළ යෝග්‍යතා/ ප්‍රායෝගික පරීක්ෂණ පවතින අධ්‍යයන පාඨමාලා සඳහා අයැදුම් කිරීමට අදාළ නොවන බව ද මෙයින් දන්වා සිටිමි.

සභාපති
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
2026.08.21